# කෘෂි තාක්ෂණ තොරතුරු

කෘෂි තාක්ෂණ තොරතුරු කඩිනමින් ගොවි ජනතාව අතරට ලබාදීමේ අත්වැලකි.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජාතික කෘෂි තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානයේ ප්‍රකාශනයකි.

තාක්ෂණික පත්‍රිකා අංක 13 - 2018 සැප්තැම්බර්

## ඔබගේ, ඔබගේ ආදරණීයයන්ගේ, මුළු මහත් සමාජයේ සහ වන සත්ත්වයින්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා වගකීමෙන් යුතුව පළිබෝධනාශක භාවිත කරමු

ශ්‍රී ලංකාවේ භාවිතය තහනම් කරන ලද සහ ලියාපදිංචි පළිබෝධනාශක වලට සමාන ඉන්දියානු නිෂ්පාදන දිවයිනේ මුහුදු කලාපය ඔස්සේ නීති විරෝධී ලෙස ප්‍රවාහනය කරන අතර වෙළඳපොලේ අප්‍රකට ස්ථාන වල සඟවා වැඩි මිලට අලෙවි කරනු ලැබේ. මෙම පළිබෝධනාශක උතුරු පළාත, නැගෙනහිර පළාත, උතුරුමැද පළාත හා ඇඹිලිපිටිය වැනි වෙනත් ප්‍රධාන කෘෂි කාර්මික ප්‍රදේශ වල සුලභව භාවිතා වේ.

එවැනි නිෂ්පාදන කීපයක තොරතුරු පහත දක්වා ඇත.

- Suntaf plus (Hexaconazole 5% SC)
- Gramosun (Paraquat dichloride 24% SL)
- Luphos 36 (Monocrotophos 36% SL)
- MAC SL (Tricontanol 40% SL)
- MAC SL (Triclophr 40% SL)




මෙම නීති විරෝධී නිෂ්පාදන වෙළඳපොළට නිකුත් කර ගොවි ජනතාව මුලා කිරීම හා ඔවුන් මාර්ගයෙන් තම අලෙවි ජාලය සූක්ෂමව ව්‍යාප්ත කිරීමට වංචනික ව්‍යාපාරිකයින් ප්‍රයත්න දැරීම සිදුවේ.

1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ ලියාපදිංචි නොකළ කිසිදු පළිබෝධනාශකයක් දිවයින තුළ නිෂ්පාදනය කිරීම, බෙදාහැරීම, ගබඩා කර තබාගැනීම, අලෙවි කිරීම හා අලෙවිය සඳහා ඉදිරිපත් කිරීම නීතිවිරෝධී සාපරාධී වරද සිදු කිරීම යටතේ ගරු මහේස්ත්‍රාත් අධිකරණයක දඬුවම් ලැබියහැකි වරද වේ.

මෙම පළිබෝධනාශක සම්බන්ධයෙන් ඔබ යම් තොරතුරක් දන්නේ නම් ඔබ දිස්ත්‍රික්කයට අදාළ සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන් සහ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරුන් දැනුවත් කරන මෙන් ඉල්ලා සිටිමි.

**තාක්ෂණික කරුණු ඃ**

**පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්, පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය, ගැටඹේ**

**දුරකථන අංකය - 081 2388076/ 081 2388135** **ෆැක්ස් අංකය - 081 2388076** web - pest@.lk email - www.doa.gov.lk

පරිගණක නිර්මාණය : ගෝතමී ලියනගේ

සැකසුම : කේ.එම් සිරිවර්ධන (තාක්ෂණික සහකාර - කෘෂි ව්‍යාප්ති)

අධීක්ෂණය හා උපදෙස් : එස්. පෙරියසාමි (අධ්‍යක්ෂ - තොරතුරු හා සන්නිවේදන), අයි.එස්.එම් හලීම්දීන් (සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ)